**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>75වන ඉන්දීය ජනරජ දිනය සැමරේ</u>**

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් 2024 ජනවාරි 26 වන දින 75 වන ඉන්දීය ජනරජ දිනය සමරන ලදී. ලොව විශාලතම ලිඛිත ව්‍යවස්ථාව වන ඉන්දියානු ව්‍යවස්ථාව බලාත්මක කෙරුණේ 1950 වර්ෂයේ ජනවාරි 26 වන දිනය. ව්‍යවස්ථාවේ පූර්විකාව ඉන්දියාව ස්වෛරී, සමාජවාදී, නිරාගමික, ප්‍රජාතාන්ත්‍රික ජනරජයක් බව ප්‍රකාශ කරයි.

2. ජනරජ දින සැමරුමේ දී මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සිය නිල නිවස වන ඉන්දියා හවුස් හිදී ඉන්දීය ජාතික ධජය එසවූ අතර හමුදා උත්තමාචාර නිරීක්ෂණය කළේය. ජනරජ දිනය නිමිත්තෙන් ඉන්දීය ජනාධිපතිතුමාගේ කථාව ද එතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

3. ශ්‍රී ලංකා නාවික හමුදා වාද්‍ය වෘන්දය විසින් ගීත ඉදිරිපත් කළ අතර මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද සංස්කෘතික වැඩසටහනක් ද පැවැත්විණ. මෙම සංස්කෘතික වැඩසටහන සඳහා ඉන්දියාවේ පොහොසත් විවිධත්වය ගෙන හැර දක්වමින් විවිධ ජන නර්තනාංග ඇතුළත් විය. යුනෙස්කෝ සංවිධානය විසින් ප්‍රකාශිත මනුෂ්‍ය වර්ගයාගේ අස්පෘශ්‍ය සංස්කෘතික උරුම ලැයිස්තුවට එක් වූ ඉන්දියාවේ නවතම උරුමය වන ගුජරාටයේ ගර්බා නර්තනය ද මෙම සංස්කෘතික වැඩසටහනට ඇතුළත් විය. ඉන්දීය ප්‍රජාවේ සාමාජිකයන් රැසක් මෙම උත්සවයට සහභාගී වූහ.

4. මෙදින උදෑසන මහ කොමසාරිස්තුමා ඉන්දීය සාම සාධක හමුදා ස්මාරකය අභියස දී මියගිය ඉන්දීය සාම සාධක හමුදාවේ රණවිරුවන් සඳහා සිය උපහාරය පුද කළේය.

5. මෙදින සන්ධ්‍යාවේ ඉන්දියා හවුස් හිදි ප්‍රිය සම්භාෂණයක් පැවැත්වෙනු ඇත. විවිධ ක්ෂේත්‍රවල සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වීමට නියමිත ය.

6. මෙම ජනරජ දිනය වන විට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් 2023 ජුලි මාසයේදී සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුර එතුමා සහ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් එකඟ වන ලද ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික හවුල්කාරිත්ව දැක්ම සය මාසයකට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබේ. පොදු සහ තිරසාර ආර්ථික සෞභාග්‍යය උදෙසා ප්‍රධානතම

සබලකාරකය ලෙස හඳුනාගෙන ඇති සම්බන්ධකතාවය සියලු පැතිකඩ ඔස්සේ ඉහළ නැංවීම සඳහා දෙපාර්ශ්වයම තවදුරටත් කටයුතු කරනු ඇත.

7. හම්බන්තොට සහ යාපනය ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය සහ මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය ද 75 වන ඉන්දීය ජනරජ දිනය නිමිත්තෙන් විශේෂ වැඩසටහන් රැසක් සංවිධානය කර තිබිණ.

***

කොළඹ
2024 ජනවාරි 26